මාධ්‍ය නිවේදන අංක 09

මැතිවරණ කොමිෂන් සභාව

මේ මොහොතේ රට තුළ පවතින අස්ථාවරභාවය සමනය කර ගැනීම හා ජනතාවගේ මූලික අවශ්‍යතා ස්ථාවරව ලබා දීම ප්‍රමුඛ කාර්යයක්ව පවතින බව මැතිවරණ කොමිෂන් සභාවේ අදහසයි. මෙම වර්ධනය වන තත්ත්වය හඳුනාගත් මැතිවරණ කොමිෂන් සභාව රාජකාරී ආරම්භ කළ විගස මහජන නියෝජිතයන් තෝරා ගැනීමේ හා ඔවුන්ගේ ක්‍රියාකාරිත්වය ජනතාවගේ අධීක්ෂණය යටතේ වන පරිදි සිදු වීම සඳහා අදාළ නීති සංශෝධන කිරීමට පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවක් පත් කරන ලෙස ඉල්ලා සිටි අතර, එය පත් කරනු ලැබීමෙන් පසුව යෝජනා රාශියක් මේ වන විටත් එම තේරීම් කාරක සභාව වෙත ඉදිරිපත් කරනු ලැබ ඇත. කෙසේ වෙතත් දේශපාලන පක්ෂ සතු අනන්‍යතාව හා ප්‍රතිපත්ති සඳහා ඔවුන්ට ඇති අයිතියට ඉහළින්ම ගරු කරන මැතිවරණ කොමිෂන් සභාව මේ අවස්ථාව මෙම ආර්ථික අර්බුදය ජය ගැනීම සඳහා සම්මුතිකාමීව රට ගොඩනැඟීම වෙනුවෙන් එක්ව කටයුතු කළ යුතු මොහොතක් ලෙස ද සලකනු ලබයි. මෙහි දී පාර්ලිමේන්තුව නියෝජනය කරන සියලු පක්ෂ නියෝජිතයන්ගෙන් සමන්විත අමාත්‍ය මණ්ඩලයක් හෝ වෙනත් යම් ව්‍යුහයක් විසින් අන්තර් කාලීන නිශ්චිත වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතු බව ද මැතිවරණ කොමිෂන් සභාවේ අදහස වන අතර, බෙහෙවින්ම වැදගත් වනුයේ "වැඩපිළිවෙළ" ක්‍රියාවට නැඟීමයි. ඒ සඳහා පහත සඳහන් කරුණු මූලික කර ගැනීම හා නිශ්චිත කාල රාමු තුළ එම යෝජනා ක්‍රියාත්මක කළ යුතු බව ද විශ්වාස කර සිටී.

01. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව (විධායකය ඉවත් කිරීම හෝ බලතල සීමා කිරීම හෝ පාර්ලිමේන්තුවේ බලය ශක්තිමත් කිරීම හෝ ආදී වශයෙන්) හා දැනට අහිතකර ලෙස විද්‍යාමාන වන විධිවිධාන ඉවත් කිරීමට සුදුසු එකඟතා ඇති කර ගැනීම හා ඒවා නිශ්චිත කාල සීමාවක් තුළ සම්මත කර ගැනීම.

02. (i) වර්තමාන ආර්ථික අර්බුදයට විසඳුම් ලබා ගැනීම අරමුණු කර ගත් රටට විදේශ විනිමය ලබා ගැනීමේ ඉලක්ක ගත වැඩපිළිවෙලක් සහිත ව්‍යාපෘති අමාත්‍යාංශ සහ අත්‍යාවශ්‍ය සේවා සැපයීම සඳහා වන විශේෂ අමාත්‍යාංශ ඇති කිරීම. මේ මඟින් අමාත්‍යාංශ, ආයතන රාශියක් මඟින් සපුරා ගත යුතු කාර්යයන් රාශියක් එකම ස්ථානයකින් කාර්යක්ෂමව සිදු කිරීම අපේක්ෂා කෙරේ. ඒ සඳහා සුදුසු විශේෂඥ දැනුමැති තැනැත්තන් පත් කර ගැනීම අත්‍යාවශ්‍ය වේ. (මෙය පවතින අමාත්‍ය ධුර සංඛ්‍යාව තුළ සිදු කළ යුතු ය.)

(ii) වර්තමානයේ පවතින සමාජීය ප්‍රශ්නවලට විසඳුමක් ලෙස ජන ජීවිතය යථා තත්ත්වයට පත්කිරීම සඳහා අත්‍යාවශ්‍ය මූලික භාණ්ඩ හා සේවා සැපයීමට හා බෙදා හැරීමේ විධිමත් යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම හා එය දිස්ත්‍රික්/ ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා ග්‍රාම සේවා නිලධාරි කොට්ඨාස දක්වා සම්බන්ධීකරණය කිරීම.

03. මහජන නියෝජිතයාට ලබා දෙනු ලබන අධි වරප්‍රසාද (වාහන බලපත්‍ර, වසර 05න් විශ්‍රාම වැටුප් ලබා දීම, විශ්‍රාම යාමෙන් පසු ජනාධිපති ධුරයට හිමිවන අධි වරප්‍රසාද) සීමා කිරීම.

04. මැතිවරණයකට යාමට පෙර අන්තර්වාර කාල සීමාව තුළ මැතිවරණ නීතියේ පහත සඳහන් සංශෝධන සිදු කිරීම. (මැතිවරණ කොමිෂන් සභාව විසින් මැතිවරණ නීති සංශෝධනය සඳහා වූ පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවට දැනටමත් යෝජනා රාශියක් ඉදිරිපත් කර ඇති අතර, අන්තර්වාර කාලය තුළ පහත යෝජනා ප්‍රමුඛත්වය දී ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය නීති සංශෝධනය කළ යුතුව පවතී

(අ) මැතිවරණ කටයුතු සඳහා දේශපාලන පක්ෂ/ අපේක්ෂකයන් සිදු කරනු ලබන දැවැන්ත වියදම් සීමා කිරීම හා ඡන්ද විමසීමකින් පසු නිශ්චිත දිනයකට පෙර ගිණුම් වාර්තා ඉදිරිපත් කිරීම හා ඒවා ප්‍රසිද්ධියට පත් කිරීමත් එහි යම් දෝෂ වෙතොත් මන්ත්‍රී සභික ධුර අහෝසි කිරීම.

(ආ) තරුණ හා කාන්තා නියෝජනය ශක්තිමත් කිරීමේ විධිවිධාන සෑම ඡන්ද විමසීම් පනතකටම ඇතුළත් කිරීම.

(ඇ) ඡන්ද විමසීම් දිනයේ, අත්‍යාවශ්‍ය සේවාවල යෙදීමට සිදු වන සේවාවල ඡන්දදායකයන් සඳහා ඡන්ද දිනයට පෙර පූර්ව ඡන්ද ප්‍රකාශ කිරීමේ ක්‍රමයක් ඇති කිරීම.

(ඈ) ඡන්දය ප්‍රකාශ කිරීමට ඡන්ද පොළට පැමිණීමට නොහැකි තැනැත්තන් සඳහා ඔවුන්ගේ නිවසට ගොස් හෝ වෙනත් විකල්ප ක්‍රමයක් මගින් ඡන්දය ප්‍රකාශ කිරීමට ක්‍රමවේද සකස් කිරීම.

(ඉ) විද්‍යුත් ඡන්ද ක්‍රමය භාවිතා කළ හැකි වන පරිදි විධිවිධාන නීතිගත කිරීම.

05. රාජ්‍ය දේපළ පෞද්ගලික පරිහරණයට ගෙන තිබේ නම් හෝ මහජන නියෝජිතයන් විසින් බලය අවභාවිතා කිරීම හෝ යම් දූෂිත ක්‍රියාවල යෙදී ඇති අවස්ථාවල හෝ මහජනයාට ඕනෑම අවස්ථාවක පැමිණිලි කිරීමේ අවස්ථාව සැලසීම හා එම පැමිණිල්ල පරීක්ෂා කර නිර්දේශ ඉදිරිපත් කිරීමට හැකි සුදුසු ස්ථාවර කොමිසමක් පිහිටුවීම (විශ්‍රාමලත් ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරන්ගෙන් සමන්විත) හා ඒ අනුව වරද අනාවරණය වන්නේ නම් ඔවුන්ට එරෙහිව සුදුසු නීතිමය පියවර ගැනීම හා ඔවුන්ගේ සිවිල් අයිතිය නිශ්චිත කාලයකට අහිමි කිරීම දක්වා කටයුතු කිරීම. (මෙය මහජන නියෝජිත ක්‍රියා සම්බන්ධව පමණක් අදාළ වන අතර, අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාවට අතිරේකව යෝජනා කරනු ලබන්නකි.) (මෙය නැවත කැඳවීමේ එක් ක්‍රමවේදයකි.)

06. නුසුදුසු අපේක්ෂකයන් සම්බන්ධව ක්‍රියා කළ හැකි පරිදි මැතිවරණ කොමිෂන් සභාව වෙත නීතිමය ප්‍රතිපාදන ලබා දීම.

07. අත්‍යාවශ්‍ය නොවන කාර්යයන් සඳහා කරනු ලබන වියදම් කපා හැරීමේ නීති සම්පාදනය කිරීම හා රාජ්‍ය සේවය ප්‍රතිව්‍යුහගත කිරීම.

08. මෙම අන්තර්වාර කාලය නිම කර මැතිවරණයක් පැවැත්වීමට කටයුතු කිරීම.

මැතිවරණ කොමිෂන් සභාවේ නියමය පරිදි

සමන් ශ්‍රී රත්නායක
මැතිවරණ කොමසාරිස් ජනරාල්

මැතිවරණ කොමිෂන් සභාව,
සරණ මාවත,
රාජගිරිය.
2022 අප්‍රේල් මස 26